**රෙදිපිළි පංගු මණ්ඩලය**

**ඈවර කිරීමේ ගිණුම - 2012**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට රෙදිපිළි පංගු මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ඈවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයෙන් තොරව රෙදපිළි පංගු මණ්ඩලය විසුරුවා හැරීම

1971 අංක 38 දරණ මුදල් පනතේ 19 වන වගන්තිය ප්‍රකාර රාජ්‍ය සංස්ථාවක් විසුරුවා හැරීම පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනාවක් මත ලැබූ බලය සහ එහි විධිවිධාන යටතේ සිදුකල යුතු වුවද, රෙදිපිළි පංගු මණ්ඩලය ඈවර කිරීමට පෙර පාර්ලිමේන්තුවට එවැනි යෝජනාවක් ඉදිරිපත් කර එමගින් ලැබූ බලයක් යටතේ සදුකර නොතිබුණි.

#### 1.2.2 ඈවර කිරීමේ ගිණුම් ඉදිරිපත් කිරීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් ගේ අංක පීඊ/ඒඩීපී/02 අංක දරන හා 2012 ජනවාර් 05 දිනැති ලිපිය මගින් මණ්ඩලයේ ඈවැර කිරීමේ කටයුතු 2012 ජූලි 10 දිනට පෙර අවසන් කිරීම සඳහා ඈවැරකරුවෙකු පත් කර තිබුණද, ඈවැර කිරීමේ කටයුතු නිම කර ගිණුම් 2013 ඔක්තෝබර් 25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2012 ජනවාරි 01 දිනට පැවති රු.3,383,157 ක් වූ මණ්ඩලයට ලැබිය යුතුව තිබූ මුදලින් කිසිදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, සම්පූර්ණ මුදලම සැසඳුම් ගිණුමට මාරුකර තිබුණි.

(ආ) රු. 195,442 ක් වූ සේවක ණය ශේෂයෙන් රු. 91,053 ක් වූ ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණන සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විස්තර සනාථ කිරීම සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීමෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| ගණුදෙනුව | මුදල<br>( රු.) | ඉදිරිපත් නොකල සාක්ෂිය |
|---|---|---|
| (1) වැටුප්, අතිකාල හා සුළු මුදල් වියදම් | 133,310 | ගෙවීම් වවුචර් |
| (2) විවිධ වියදම් | 433,393 | ගෙවීම් වලට අදාල බිල්පත් |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය ඈවර කිරීම් අවසානයේ වත්කම් සහ වගකම් පියවීමෙන් පසු රු.15,325,992 ක පාඩුවක් සිදුව තිබූ අතර, එය සමුච්චිත අරමුදල් ගිණුමට මාරු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් පැවරීම

2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව පැවති රු.38,074,620 ක් වටිනා සියළුම ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශුද්ධ අගයට රාජ්‍ය ආයතන කිහිපයකට පවරා දී තිබුණි.

### 3.2 ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීම

සියළුම වත්කම් හා බැරකම් පියවීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයට අයත් බැංකු ගිණුම් දෙකක රු. 29,246,995 ක වාසිදායක ශේෂයක් පැවතුනු අතර, එය 2013 ඔක්තෝබර් මස නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ ගිණුම් අංක 2422267 ට බැර කර බැංකු ගිණුම් වසා දමන ලෙසට බැංකුවට උපදෙස් ලබාදී තිබුණි.